කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය - 2016
---------------------------------------------

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පනතේ 15 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම
---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි.

**1.4** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-------------------------------------**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**--------------------------------------**

**පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.**

**(අ)** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

**-----------------------------------------**

**ප්‍රමිතයේ 106 ඡේදය ප්‍රකාරව ආදායම් හා වියදම් අයිතම ප්‍රමාණාත්මක වන විට ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය වෙන වෙනම හෙළිදරව් කළ යුතු වුවත් හන්තාන ප්‍රාදේශීය කාර්යාලයේ මව් පඳුරු (Mother bush) ආදායම රු.228,275 ක් හා වියදම රු.999,375 ක් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණු අතර එහි රු.771,100 ක් වූ ශුද්ධ ප්‍රතිඵලය සංවර්ධන වියදමක් ලෙස සටහන් කර තිබුණි.**

**(ආ)** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

**-----------------------------------------**

**ප්‍රමිතයේ 25(ආ) ඡේදය ප්‍රකාරව අධිකාරියේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී ජංගම නොවන වත්කම් විකිණීමෙන් ලැබූ මුදල් රු.31,000 ක් අඩුවෙන් දක්වා තිබූ අතර එම වෙනස කාරක ප්‍රාග්ධනය යටතේ වූ ලැබිය යුතු ශේෂයට ගලපා තිබුණි.**

**(ඇ)** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

**-------------------------------------------**

**ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති රු.15,340,175 ක වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.**

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08

---------------------------------------------

ප්‍රමිතයේ 100 ඡේදය ප්‍රකාරව අධිකාරිය විසින් පවරා ඇති නඩුවල වර්තමාන තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

**2.2.2** ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ ) සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ ස්ථිර තැන්පතු හා ඉල්ලුම් තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය රු.1,786,031 ක් වුවද එය රු.1,467,246 ක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂයේ පොළී ආදායම රු.318,785 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය විසින් පාංශු සංරක්ෂණය වෙනුවෙන් දරා තිබු රු.655,439 ක් වූ වියදම, වියදම් ගිණුමට සටහන් කිරීම වෙනුවට ණයහිමින්ට ගෙවීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) හන්තාන ප්‍රාදේශීය කාර්යාලයේ 2015 දෙසැම්බර් 07 දින විශ්‍රාමලත් නිලධාරියෙකු වෙනුවෙන් පාරිතෝෂිත දීමනාව 2016 අප්‍රේල් 08 දින ගෙවීම් කර තිබියදී එම නිලධාරියා වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා නැවත පාරිතෝෂික ලෙස රු.167,860 ක් ප්‍රතිපාදනය කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ හන්තාන ප්‍රාදේශීය කාර්යාලයට අයත් පැල තවාන වෙනුවෙන් වියදම් වූ රු.327,175 ක් නොනිමි තොග ලෙස සටහන් කිරීම වෙනුවට අවසන් තොග ලෙස සටහන් කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී සංවර්ධන වියදම් දැරීම සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.624,400,000 ක මුදලින් රු.570,617,000 ක් පමණක් වැයකර ඉතිරි මුදල වූ රු.53,783,000 ක් භාණ්ඩාගාරයට යැවිය යුතු වගකීමක් ලෙස සටහන් කිරීම වෙනුවට සංවර්ධන වියදම් සඳහා ලද ප්‍රදාන, වශයෙන් ස්කන්ධ ප්‍රාග්ධනය යටතේ ගිණුම්ගත කර තිබුණි.

**2.2.3** පැහැදිලි නොකල වෙනස්කම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ලෙජර් ගිණුම් 06 ක හා ඊට අනුරූපීව ඉදිරිපත් කරන ලද උපලේඛනයන් අතර රු.105 සිට රු. 109,972 දක්වා පරාසයක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ගිණුම් අනුව තේ පර්යේෂණ ආයතනයට අයත් ශාන්ත කුම්බස් තේ කම්හලෙන් ලැබිය යුතු ලෙස රු.340,300 ක් දක්වා තිබුණද එම ආයතනයේ ගිණුම් අනුව එම වටිනාකම රු.256,641 ක් ලෙස දක්වා තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට වසර 05 ඉක්මවූ ණයගැතියන්ගේ වටිනාකම රු.22,191,909 ක්වූ අතර, එය මුළු ණයගැති ශේෂයෙන් සියයට 94 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1998 වර්ෂයේ ණය පදනම මත වාහන ලබා දීම වෙනුවෙන් කුඩා තේ වතු සමිති 11 ක් වෙත ලබාදුන් මුදලින් සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.7,131,430 ක් අධිකාරියට අයවිය යුතුව පැවතුණි.

(ආ) 1998 වර්ෂයේ තේ කම්හල් සඳහා වර්ණ විභේදන යන්ත්‍ර ලබාදීමේ වැඩ සටහන මඟින් ලබාදී තිබූ ණය මුදලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට කම්හල් 4 කින් රු.5,916,589 ක මුදලක් අධිකාරියට අයවිය යුතුව තිබුණි.

උක්ත වත්කම් පැවරීදීමේදී හා ණය ප්‍රදානයන්වලදී විධිමත් ගිවිසුම් යටතේ සිදු නොකිරීම හේතුවෙන් අදාල ණය අයකර ගැනීමේ ගැටළු සහගත තත්ත්වයක් මතු වී තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | යම් නිලධාරියකු විසින් කිසියම් කාර්යයක් සඳහා ගනු ලැබූ අත්තිකාරම් මුදල් අදාල කාර්යයන් නිමවූ විගස පියවීමට කටයුතු කළ යුතු වුවත්, අවස්ථා 08 කදී ලබා ගන්නා ලද රු.636,865 ක් වූ අත්තිකාරම් මුදල් විගණිත දිනය වූ 2017 පෙබරවාරි 09 වන විට දින 11 සිට දින 275 දක්වා කාලයක් ප්‍රමාද වී ඇතත් නිරවුල් කර නොතිබුණි. |
| (ආ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ධාවනයෙන් ඉවත්කරන ලද වාහන 03 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2014 ජූලි 04 දිනැති පරිපූරක 28 | මෝටර් වාහන අළුත්වැඩියා සම්බන්ධයෙන් රු.200,000 ක් ඉක්මවන අළුත්වැඩියා සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද අවස්ථා 2 කදී වාහන 2 ක අළුත්වැඩියා කිරීම් වෙනුවෙන් දරන ලද එකතුව රු.527,467 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,322,996 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.19,855,934 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය ප්‍රතිඵලයේ රු.23,178,930 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික ප්‍රතිපාදනය රු.22,996,714 කින් අඩුවී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.154,165,000 ක්වූ ඌනතාවය උච්චාවචනයන් සහිතව 2016 වර්ෂයේදී රු.3,322,996 ක අතිරික්තයක් බවට පත් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් හා රජයට ගෙවන ලද බදු නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.54,784,000 ක්වූ දායකත්වය 2016 වර්ෂයේදී රු.277,053,385 ක්වී තිබුණි.

### 3.2 අධිකාරියට එරෙහිව හෝ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

---

අධිකාරියේ සේවකයන් විසින් අධිකාරියට එරෙහිව නඩු 07 ක් ද, අධිකාරිය විසින් සේවකයන්ට එරෙහිව නඩු 02 ක් ද ගොනුකර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අවසන් වනවිටත් ඒවා නිමකර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනතේ 14 වන උප වගන්තිය ප්‍රකාරව හා 2003 අංක 34 දරන සංශෝධිත පනත අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ අරමුණු පහත සඳහන් පරිදි වේ.

- ❖ කුඩා තේ වතු සහ තමන්ගේම නිෂ්පාදන මාර්ග නොමැති වෙනත් තේ වතු පිළිබඳ දත්ත එකතු කිරීම හා සංවර්ධනයට අනුබල දීම හෝ සංවර්ධනය කිරීමට භාර ගැනීම.

- ❖ එම තේ ඉඩම් වල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය තේ කර්මාන්තශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම හෝ සංවර්ධනය කිරීම.

- ❖ මෙම තේ ඉඩම්වල හෝ එකී කර්මාන්තශාලාවල කෙරෙන නිෂ්පාදන අලෙවිය දියුණු කිරීම හෝ අලෙවි කිරීම භාර ගැනීම.

- ❖ කුඩා තේ ඉඩම් හිමියන්ගේ සුභ සිද්ධිය පිණිස කටයුතු කිරීම හා කුඩා තේ වතුවල ආයෝජනය ප්‍රවර්ධනය කිරීම.

❖ උචිත ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යාංශයට උපදෙස් දීම සහ වෙනත් අදාල නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

ඉහත අරමුණු ඉටුකර ගැනීමට අදාළව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය සඳහා කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය සියයට 74.5 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම දායකත්වය සියයට 72.91 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව ජාතික නිෂ්පාදනය සඳහා කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය වැඩිවී තිබුණද කුඩා තේ වතු හිමියන්ගේ නිෂ්පාදනය සමාලෝචිත වර්ෂය තුළ කිලෝග්‍රෑම් මිලියන 218.06 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය කිලෝග්‍රෑම් මිලියන 239.86 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ කුඩා තේ වතුහිමියන්ගේ නිෂ්පාදනය ඉකුත් වර්ෂයට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 21.79 ක් හෙවත් සියයට 9 කින් අඩුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කුඩා තේ ඉඩම් අංශයේ සාමාන්‍ය ඵලදායීතාවය හෙක්ටයාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම් 1872 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය කිලෝ ග්‍රෑම් 2059 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය ඵලදායීතාවය කිලෝ ග්‍රෑම් 187 ක් එනම් සියයට 09 කින් පහල ගොස් තිබුණි.

ඉහත (අ) සහ (ආ) හි සඳහන් කරුණු වලට සමාලෝචිත වර්ෂයේ පැවති අයහපත් කාලගුණික තත්ත්වය ද හේතු වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) තේ නැවත වගා කිරීම හා නව වගා කිරීම්, ව්‍යාප්ත සේවා හා සමාජ සංවර්ධනය සහ ආයතනික ශක්තිමත් කිරීම වැනි සංවර්ධන කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. 624,000,000 ක සහනාධාර මුදලක් ලබා දී තිබුණි. දරන ලද වියදමට සාපේක්ෂව ලබා ඇති ප්‍රගතිය පහත පරිදි වේ.

(i) අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුව උපරිම ඵලදාවක් ලබමින් තේ වගා භූමි ප්‍රමාණය ස්ථායීව පවත්වාගැනීම සඳහා පවත්නා කුඩා තේ භූමි ප්‍රමාණයෙන් සියයට 2 ක් නැවත වගා කිරීම ජාතික ප්‍රතිපත්තිය වුවද වර්ෂයේ ලද ප්‍රතිපාදන අනුව ඉලක්ක පිහිටුවීම සීමාකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ නැවත වගාව සඳහා ඉලක්ක ගත භූමි ප්‍රමාණය හෙක්ටයාර් 1000 ක් වුවද වර්ෂයේ නැවත වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 741 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ කාර්යය සාධනය සියයට 74 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී එය සියයට 8 ක අඩුවීමක් වුවද ලබාදෙන ලද සහනාධාර මුදල ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 16 කින් වැඩි වී තිබුණි. අයහපත් කාලගුණික සාධක සහ තේ වගාකරුවන් විසින් බිම් සැකසීම හා පාංශු පුනරුත්ථාපනයෙන් පසු නැවත වගාව සඳහා යොමු නොවීම ද මේ සඳහා හේතු වී තිබුණි.

(ii) පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතය, කප්පාදුව, සෙවන පාලනය සහ පාළු සැපයීම සඳහා ලබාදෙන ලද භෝග පුනරුත්ථාපන සහනාධාර ක්‍රමය යටතේ සමාලෝචිත වර්ෂයේ පැල 483,333 ක් සිටුවීමට ඉලක්ක කර තිබුණද පාලු සැපයීම නිමකර තිබූ පැල ප්‍රමාණය 367,876 ක් වූයෙන් නිමකල ප්‍රතිශතය සියයට 76 ක් විය.

(iii) තේ අළුත් වගාව සඳහා සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත ප්‍රමාණය මත කාර්යසාධනය සාර්ථකව ඉටුකර තිබූ නමුත් ඉකුත් වර්ෂයට සාපේක්ෂව බිම් සැකසීම හා නඩත්තුව සඳහා ඉලක්ක පිහිටුවීම පිළිවෙලින් සියයට 72 කින් හා සියයට 76 කින් පහල දමා තිබූ අතර ගෙවන ලද ආධාර මුදල ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.81,395,256 කින් එනම් සියයට 64 කින් අඩුවී තිබුණි.

(ඈ) කුඩා තේ වතු හිමියන්ට තේ පැල මිලදී ගැනීමේදී ගුණාත්මක තේ පැල මිලදී ගැනීමට හා වෙළඳපල මිල ගණන් පාලනය කිරීම සඳහා අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන ආයතනික තේ තවාන් **08** සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

(i) තේ තවාන් උපදෙස් මාලාව අනුව පැල තවානක අවම අලෙවි මට්ටම සියයට **85** ක් ලෙස පවත්වාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ හන්තාන තවාන පමණක් අපේක්ෂිත මට්ටමට ළගා වී තිබුණි. පැල හොඳින් නඩත්තු කොට වසර අවසන් වීමට පෙර අලෙවි කිරීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතු වුවත් තවාන් තුල ඉතිරි වූ පැල ප්‍රමාණය, යෙදූ පැල සංඛ්‍යාවෙන් සියයට 27 සිට සියයට 74 දක්වා විය. ඒ ඒ පළාත්වල පැවති කාලගුණික වෙනස්වීම් හේතුවෙන් පැලවල ගුණත්වය පවත්වා ගැනීමට නොහැකිවීම මත, තේ වගා කරුවන්ගේ ඉල්ලීමේ අඩු වීම මේ සඳහා හේතු වී තිබුණි.

(ii) තවාන් කළමනාකරණ උපදෙස් මාලාවේ අංක **4.2** ප්‍රකාරව තවාන්වල පැල මියයාමේ ප්‍රතිශතය සියයට **10** කට අඩු මට්ටමක පවත්වාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ තවාන් **03** ක නිර්දේශිත පැල විනාශවීමේ ප්‍රතිශතය සියයට **13** සිට සියයට **31** දක්වා පැවතුණි. තවාන් සඳහා පැල සම්පාදන ගැටළු පැවතීමත් භාවිතා කරන ලද පස් නුසුදුසු තත්ත්වයේ පැවතීමත් මේ සඳහා හේතු වී තිබුණි.

(iii) අවම වශයෙන් පැල නිෂ්පාදනය සඳහා දැරූ වියදම හෝ ආවරණය කර ගත යුතු බව තේ තවාන් කළමනාකරණ උපදෙස් මාලාවේ අවධාරණය කර තිබුණද සමාලෝචිත වර්ෂයේ ආයතනික තේ තවාන් **08** න් තවාන් 04 ක් ආදායම ඉක්මවා වියදම් දරා තිබුණි.

(ඉ) තේ නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩිකිරීම සඳහා කුඩා තේ වතු හිමියන්ට ගුණාත්මක පැල ලබාගැනීමට අධිකාරියේ ලියාපදිංචි වාණිජ තේ පැල තවාන් පවත්වාගෙනයාම හා අධීක්ෂණය සම්බන්ධයෙන් පසුගිය තෙවසරක කාලය සැලකීමේදී 2014/**2015** වර්ෂයට සාපේක්ෂව **2016/2017** වර්ෂයේ නිකුත් කල අවසර පත්‍ර ප්‍රමාණය සියයට **66.5** කින් අඩු වී තිබුණි.

## 4.2 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-----------------------------------------

අධිකාරියේ ප්‍රධාන කාර්යාල භූමියේ උද්‍යාන අලංකරණය කාර්යය සඳහා රු.**4,366,397** ක් වැය කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමාණ පත්‍රයන්හී සී-**2** අයිතමය යටතේ සිමෙන්ති ගල් වෙනුවට කළු ගල් යොදා පොයින්ට් බැම්ම බැඳීම වෙනුවෙන් වර්ග මීටරයක් සඳහා ගිවිසුම අනුව එකඟ වූ රු.**6,000** ක් වූ රේටය වෙනුවට වර්ග මීටරයකට රු.**8,141** ක් බැගින් ගෙවා තිබීම හේතුවෙන් රු.**220,643** ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

(ආ) ගුණාත්මක තේ පැල සැපයීම සඳහා පවත්වාගෙන යනු ලබන ආයතනික තේ තවාන් **9** ක් අධිකාරිය සතුව පැවතියද ඉහත උද්‍යාන අලංකරණ කාර්යය සඳහා බාහිර සැපයුම්කරුවන්ගෙන් රු.**116,385** ක් වැයකර තේ පැල මිලදී ගෙන තිබුණි.

**4.3** කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කුඩා තේ වතු හිමියන්ට තේ නැවත වගා සහනාධාර ලබාදීමේදී අවසර පත්‍ර නිකුත් කල දින සිට වර්ෂ 03 ක කාලයක් තුල පැල සිටුවා අවසන් කල යුතු අතර එසේ නිම කිරීමට අපොහොසත් වූ අවස්ථා වලදී තේ නැවත වගා සඳහා සහනාධාර ලෙස ගෙවා ඇති මුදල් ආපසු අයකර ගැනීමට හෝ වගාව සම්පූර්ණ කිරීමට විකල්ප ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු කලයුතු වුවත් කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ පළමු, දෙවන හා තුන්වන වාරික සඳහා පිළිවෙලින් රු.678,204 ක්, රු.209,779 ක් හා රු.720,381 ක් ලෙස එකතුව රු.1,608,364 ක මුදලක් ලබා ගෙන වගාව අතරමගදී අත්හැර දමා තිබුණි. නමුත් ඒ සම්බන්ධයෙන් කළමනාකරණය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය කාර්යාල හතරක පිහිටුවා තිබූ රු.14,091,861 ක් වටිනාකම වූ ඉඩම් අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ඉඩම්වල රු.58,220,553 ක් වටිනා ගොඩනැගිලි ඉදිකර තිබුණි.

(ඇ) ගාල්ල ප්‍රාදේශීය කාර්යාලට අයත් වලහන්දූව උපකාර්යාලය, පැලතවාන හා අක්මීමන මව් වගා ව්‍යාප්ති මධ්‍යස්ථානය ආදියෙහි ඉඩම් හා ගොඩනැගිලි අධිකාරියට පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.4** අරමුදල් ඌන උපයෝජනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාංශු ආධාර ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන කාර්යාලයට හා ප්‍රාදේශීය කාර්යාල වෙත 2014 සහ 2015 වර්ෂයන්හි ලැබී තිබුණු රු.මිලියන 795.47 ක මුදලින් සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටත් රු.මිලියන 32.08 ක් අදාල කාර්යය සඳහා භාවිතාකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සංවර්ධන කටයුතු සඳහා ලැබී තිබුණු රාජ්‍ය ප්‍රදාන රු.624,400,000 කින් අදාල සංවර්ධන කාර්යයන් සඳහා රු.62,532,020 ක් භාවිතා කර නොතිබුණි.

**4.5** නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------

අධිකාරිය සතු නිල නිවාස 06 ක් වසර 05 කට වැඩි කාලයක සිට භාවිතයට ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවැතුණි.

**4.6** කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------

අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 430 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 395 ක් විය. තවද එදිනට කළමනාකරණ සහකාර තනතුරු 12 ක් හා කාර්යාල සහායක තනතුරු 17 ක් දරන්නාට පමණක් පෞද්ගලික වනසේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට කළමනාකරු(සංවර්ධන), කළමනාකරු(පුහුණු) තනතුරු 2014 වසරේ සිටද කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) තනතුර 2010 වර්ෂයේ සිට ද පුරප්පාඩුව පැවතුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී අනියම්, වෙක්රෝල් හා කොන්ත්‍රාත් පදනම මත අධිකාරිය විසින් සේවකයින් 26 දෙනෙකු බඳවාගෙන තිබුණි. ඉහත බඳවා ගැනීම් සඳහා 2016 වර්ෂය තුළ වෙක්රෝල් සේවකයින් වෙනුවෙන් රු.1,024,980 ක් ද අනියම් සේවකයින් වෙනුවෙන් රු.829,536 ක මුදලක්ද අනුමැතියෙන් තොරව ගෙවා තිබුණි.

(ඇ) අධිකාරියෙහි වාර්ෂික වාර්තාව අනුව ඵලදායී ව්‍යාප්ති සේවාවක් සඳහා ව්‍යාප්ති නිලධාරියෙකුට වගාකරුවන් සංඛ්‍යාව 1:1000ක් විය යුතු වුවත් ඉකුත් වර්ෂයේ 1:2748 ක් ව පැවති මෙම අනුපාතය සමාලෝචිත වර්ෂයේ 1:2751 දක්වා වැඩි වී තිබුණි.

(ඈ) වැඩබැලීම සඳහා පත්වීම් ලබාදීමේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13:1:2 සහ 13.4 වගන්ති ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීම සඳහා නිර්දේශ කරනු ලබන නිලධාරියාට අනුමත බඳවාගැනීමේ පටිපාටිය අනුව සෑම අතින්ම සුදුසුකම් තිබිය යුතු අතරම සෑම අතින්ම පූර්ණ සුදුසුකම් නොලත් නිලධාරියකු පත් නොකළ යුතුය. එසේ වුවද කළමනාකරු (සංවර්ධන) තනතුර හා කළමනාකාරු (මානව සම්පත්) තනතුර සඳහා වැඩබැලීම් පත්වීම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.1 ඡේදය පරිදි මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2017 මැයි 09 දිනදීය.

### 5.2 අභ්‍යන්තර විගණනය

---

සමාලෝචිත වර්ෂය තුළදී අභ්‍යන්තර විගණන අංශය විසින් හඳුනාගත් නිරීක්ෂණ ඇතුළත් පරීක්ෂණ වාර්තා 24 ක් නිකුත්කර තිබුණද , කළමනාකරණය විසින් ඉන් පරීක්ෂණ වාර්තා 15 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර 2013, 2014 වර්ෂයන්හි දී නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන විමසුම් පහක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගෙන තිබූ තීරණ ක්‍රියාත්මක කර නොතිබුණි.

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

---

අධිකාරිය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකසා තිබුණද නියමිත කාල රාමුව තුළදී ප්රසම්පාදන කාර්යයන් ඉටුකිරීමට නොහැකිවී තිබූ අතර මිලදී ගැනීමට සැලසුම් කල දින සිට මාස 4 දක්වා වූ ප්‍රමාද කාලයක් පැවතුණි.

### 5.4 අයවැය ලේඛනමය පාලනය

---

අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 67 සිට සියයට 86 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | තනතුරුවල පුරප්පාඩු පැවතීම. විධිමත් අනුමැතියකින් තොරව බඳවා ගැනීම් සිදුකිරීම. |
| (ආ) | සහනාධාර ගෙවීම් | සහනාධාර ගෙවීම සඳහා ලද මුදල් උපයෝජනය නොකිරීම. |
| (ඇ) | වත්කම් පාලනය | වත්කම් විධිමත් ලෙස පවරා නොගැනීම හා වත්කම්වල ඵලදායී ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම. |